

## ඔබගේ ගිණුම් සහ සේවා ආරක්ෂිතව තබාගන්න

- ඔබට අයත් නොවන මුදල් හෝ වත්කම් හැසිරවීමට අන් අයට උදව් කිරීමෙන් වළකින්න ගෙවීම් සිදු කිරීමට අන් අයට උපකාර කිරීම හෝ ඔබගේ ව්‍යාපාරයට අයත් නොවන වත්කම් හැසිරවීමෙන් වළකින්න
- ඔබට අයත් නොවන මුදල් හෝ වත්කම් හැසිරවීමට අන් අයට උදව් කිරීමෙන් වළකින්න let others operate your account without your authorisation
- ඔබගේ පෞද්ගලික විස්තර, ගිණුම් තොරතුරු, ආරක්ෂණ උපාංගය, අන්තර්ජාල බැංකු හැඳුනුම සහ මුරපදය, ATM කාඩ්පත, ණයවර කාඩ්පත, කාඩ්පත් සත්‍යාපන අගය හෝ චෙක් පොත අන් අය සමග බෙදාහදා ගැනීමෙන් වළකින්න
- අන් අය සමග ඔබගේ ආරක්ෂිත තැන්පතු ලොකරය බදුදීම, යම් උප බදු දීමකින් අවසරදීම හෝ එය අන් අය සමග හවුලේ භාවිතය නොකරන්න
- නීති විරෝධී අරමුණක් හෝ පුපුරණ ද්‍රව්‍ය හෝ මළ බැඳීම සිදු කරන ද්‍රව්‍ය වැනි දේ ගබඩා කිරීම සඳහා ඔබගේ ආරක්ෂිත තැන්පතු ලොකරය භාවිතා කිරීමෙන් වළකින්න. අන් අයට හිරිහැරයක් වන ආකාරයකින් එය භාවිතා කිරීමෙන් වළකින්න. අදාළ නියමයන් සහ කොන්දේසි කඩවීමක දී, අපට ඔබ වෙත ආරක්ෂිත තැන්පතු ලොකර් සේවා පිරිනැමීම නැවැත්වීමට අවශ්‍යය විය හැකිය
- ඔබට හෝ ඔබ විසින් පත් කළ නියෝජිතයාට පමණක් ඔබගේ ආරක්ෂිත තැන්පතු ලොකරය වෙත යාමට අවසර දී ඇති බව තහවුරු කරගන්න
- බැංකුවේ නාමයෙන් සිදු කරන බවට කියාපාන දුරකථන වංචා සහ තතුබෑම් විද්‍යුත් තැපැල් වලට එරෙහිව සුපරීක්ෂාකාරී වන්න
- ප්‍රති-වයිරස මෘදුකාංගයක්, ආරක්ෂිත ජාල සම්බන්ධතාවයක් සහ ගිනිපවුරු ආරක්ෂාවක් භාවිතා කරමින් ඔබගේ පරිගණක ආරක්ෂාව යාවත්කාලීන බව තහවුරු කරගන්න

# ඔබගේ පාරිභෝගික තොරතුරු යාවත්කාලීනව තබා නොගතහොත් සිදුවිය හැක්කේ කුමක්ද?

**අපගේ පාරිභෝගිකයන් සියලු දෙනා පිළිබඳ නිවැරදි තොරතුරු සතු වීම මුදල් විශුද්ධිකරණය, වංචනික මුදල් හුවමාරුව සහ බදු පැහැර හැරීම හඳුනාගැනීම සහ ඊට බාධා කිරීම සඳහා වන අපගේ හැකියාවේ ප්‍රධාන කොටසකි.**




- ඔබගේ යාවත්කාලීන තොරතුරු නොමැතිවිට, ඔබගේ වර්තමාන පැතිකඩට ගැළපෙන බව නොපෙනෙන ගිණුම් ගනුදෙනු පැහැදිලි කරන ලෙස අපට ඔබගෙන් ඉල්ලීමට සිදුවිය හැකිය. උදාහරණවලට ඇතුළත් වන්නේ ඔබගේ සාමාන්‍යි පුද්ගලික ගිණුම් පැතිකඩට නොගැළපෙන සහායක ලේඛන නොමැති විශාල තැන්පතු සහ විශාල විදේශ මුදල් ගනුදෙනු හෝ මුදල් තැන්පතු වැනි වලංගු කිරීමට අසීරු ඒවාය

- ඔබගේ පුද්ගලික ගිණුමේ අසාමාන්‍ය ක්‍රියාකාරකම පැහැදිලි කළ නොහැකි නම්, අපට විදේශ රටවලට මුදල් යැවීම් වැනි සමහර බැංකු සේවා ප්‍රමාද කිරීමට හෝ සීමා කිරීමට නැතහොත් ඔබ සමග අපගේ බැංකුකරණ සම්බන්ධතාවය අවසන් කිරීම හැර වෙනත් විකල්පයක් නොමැති විය හැකිය

- තොරතුරු සඳහා අපගේ ඉල්ලීම් වලට ප්‍රතිචාර දැක්වීම අපට ඔබගේ ගිණුම්වලක්‍රි යාකාරකම වටහා ගැනීමට උපකාර කරන අතර අනපේක්ෂිත ලෙස සේවා කඩාකප්පල් වීම හෝ ගිණුම් වසා දැමීම සිදු නොවන බව තහවුරු කරයි

- ඔබගේ ගිණුමේ වෙනස්ක්‍රියාකාරකම්වලට හේතුවිය හැකි ඔබගේ තොරතුරු වලට සිදුවන වෙනස්කම් පිළිබඳව හැකි ඉක්මණින් ඔබගේ බැංකුව දැනුවත් කරන්න - උදාහරණ ලෙස, පවුලේ වාතාවරණ, රැකියාව හෝ ඔබ ජීවත්වන රට/භූමි ප්‍රදේශය වෙනස්වීම



# මූල්‍යන අපරාධවලට එරෙහිව අපට එකට එක් වී වැඩ කළ හැකි ආකාරය



**අප සියලු දෙනාම මූල්‍යව අපරාධ වලින් ආරක්ෂා කෙරෙන මූල්‍යළ පද්ධතියේ අවංකත්වය ආරක්ෂා කිරීමට අපි කැපවී සිටිමු. අපි ඔබගෙන් ඉල්ලා සිටින තොරතුරු මෙය ඉටුකර ගැනීමට අපට උපකාරී වනු ඇත.**

## අපගෙන් ඔබට තොරතුරු ඉල්ලීමක් ලදහොත් ඔබ කළ යුත්තේ කුමක්ද?

- අපගෙන් ලැබෙන ලිපි, විද්‍යුකත් තැපැල සහ ඇමතුම් පිළිබඳ අවධානයෙන් සිටින්න
- තොරතුරු සඳහා අපගේ ඉල්ලීම් වලට කාලීන ආකාරයකින් ප්‍රෙතිචාර දක්වන්න
- ඔබ අපට සපයන තොරතුරු සම්පූර්ණ, නිවැරදි සහ යාවත්කාලීන බව තහවුරු කරගන්න
- ඔබට ඔබගේ පුද්ගලික තොරතුරු යාවත්කාල කිරීම පිළිබඳ විමසීම් කිසිවක් තිබේ නම් අප හා සම්බන්ධ වීමට පසුබට නොවන්න




## අප හා සම්බන්ධ වන්න

කරුණාකර හෝං කොං ඕනෑම HSBC ශාඛාවක් වෙත පැමිණෙන්න නැතහොත් (852) 2233 3322 (HSBC ප්‍රලමුඛ පාරිභෝගිකයන්), (852) 2748 8333 (HSBC උසස් පාරිභෝගිකයන්) හෝ (852) 2233 3000 (වෙනත් පුද්ගලික පාරිභෝගිකයන්) අමතන්න

වානිජ බැංකු කටයුතු සඳහා ඕනෑම HSBC ව්‍යාපාරික මධ්‍යස්ථානයකට පැමිණෙන්න නැතහොත් අපගේ වානිජ බැංකු සේවා ක්ෂණික ඇමතුම් අංකය (852) 2748 8288 (භාෂාව තෝරාගත් පසු #-0 ඔබන්න) අමතන්න

MIX
Paper from responsible sources
FSC™ C009014
www.fsc.org

Hongkong and Shanghai Banking Corporation Limited (HSBC) විසින් නිකුත් කරන ලදී

# ඔබගේ බැංකු ගිණුම පහසුවෙන් කළමනාකරණය

හොං කොං හි පුද්ගලික පාරිභෝගිකයන්
සඳහා මාර්ගෝපදේශයක්



HSBC

# මෙම මාර්ගෝපදේශය සහය විය හැක්කේ කෙසේද?

**ඔබේ බැංකු ගිණුම සහක්‍රියාකාරකම් නිසි ලෙස කළමනාකරණය කිරීම ඔබේ මෙන්ම පුළුල් ප්‍රජාවගේ මුදල් ද සුරක්ෂිත කරනු ඇත.**

ඔබගේ බැංකු කටයුතු අවංකව සිදුවන බවට තහවුරු කිරීමට, එය වංචාව සහ මූල්‍ය අපරාධ වලින් ආරක්ෂිතව තබාගැනීමට පහත දේ පිළිබඳව මෙම මාර්ගෝපදේශය ප්‍රයෝජනවත් ඉඟි සපයයි:

- ඔබගේ ගිණුම එදිනෙදා හොඳින්ම කළමනාකරණය කරන ආකාරය
- ඔබගේ පාරිභෝගික තොරතුරු යාවත්කාලීනව තබා නොගතහොත් සිදුවිය හැකිදේ
- මූල්‍යන අපරාධවලට එරෙහිව අපට එකට එක් වී වැඩ කළ හැකි ආකාරය


# ඔබගේ ගිණුම එදිනෙදා හොඳින්ම කළමනාකරණය කරන ආකාරය



**ඔබට ඔබගේ ගිණුම ඵලදායීව කළමනාකරණය කිරීමට සහ වංචාවට සහ මූල්‍යය අපරාධ වලට එරෙහිව ඔබව ආරක්ෂා කිරීමට උපකාර කළ හැකි සමහර පුරුදු සහක්‍රිඩයාමාර්ග සමහරක් පහත දැක්වේ:**

## පුද්ගලික ගිණුම් පුද්ගලික භාවිතය සඳහා පමණක් තබාගන්න

- සැපයුම්කරුවන්ට ගෙවීම හෝ විකුණුම් ආදායම් ලැබීම වැනි ව්‍යාරපාරික අරමුණු ගිණුමේ අරමුණ සඳහා සුදුසු නොවන බැවින් සහ වලංගු කිරීමට අපහසු බැවින් එයට ඔබගේ පුද්ගලික ගිණුම භාවිතා කිරීමෙන් වළකින්න. මෙම රටා මුදල් විශුද්ධිකරණය, වංචාව හෝ බදු පැහැර හැරීම වැනි නුසුදුසුක්‍රි යාකාරකම් තුළද දර්ශීය වශයෙන් නිරීක්ෂණය වන ඒවාට සමාන වන බැවින් එවැනි ගනුදෙනු බැංකු වලට ද අනතුරු ඇඟවිය හැකිය



- ව්‍යාපාර හිමිකරුවන් සිය ව්‍යාසපාරික අයිතිවාසිකම් වලින් වැටුප් ආදායම, අධ්‍යක්ෂකගේ වේතනය, ගිණුම්ගත කළ අධ්‍යක්ෂකගේ ණය ආපසු ගෙවීම, ලාභාංශ, හිමිකාරීත්ව කොටස් විකිනීම හෝ මිලදී ගැනීම සහ පුද්ගලික වියදම් ගෙවීම වැනි නීත්‍යානුකූල ගෙවීම් ඒවා නිවැරදිව ලේඛනගත කර ඇති බවට සැලකීමෙන් සිය පුද්ගලික ගිණුම්වලට ලබාගැනීමේ ගැටළුවක් නැත





- ඔබගේ ව්‍යාවපාරික අවශ්‍යතතා සඳහා ව්‍යා,පාරික බැංකුකරණ සේවා භාවිතයට ගෙන පුද්ගලික පාරිභෝගිකයන්ට ලද නොහැකි විශේෂිත පහසුකම්, නිෂ්පාදන සහ උපදෙස් අත්විඳින්න. විකුණුම් ආදායම් ඔබගේ පුද්ගලික ගිණුම ඔස්සේ ගෙන්වා ගැනීම ඔබගේ ව්‍යාආපාරික ගිණුම් සහ බදු තත්වය විකෘති කරනු ඇති අතර, එහි මූල්‍යු පහසුකම් වලට පිවිසීමට ද බළපෑමට ඉඩ ඇත

- ඔබ විශේෂිත කාල සීමාවක් තුළ ඔබගේ ගිණුමට අසාමාන්‍ය ලෙස ඉහළ අගයක හෝ ප්‍රීමාණයක් ගනුදෙනු ලැබීමට බලාපොරොත්තු වන්නේ නම් ඔබගේ බැංකුවට වහාම දන්වන්න - උදාහරණ ලෙස, නව අරමුදල් මූලාශ්‍රන හෝ තෙවන පාර්ශ්වවල ගනුදෙනු සැලකිය හැකිය

## හොඳින් වාර්තා තබාගන්න

- ඔබගේ බැංකු ගිණුම් නිතිපතා පරීක්ෂා කර ඔබගේ බැංකු ප්‍රාකාශන සමග සියලුක්‍රියාකාරකම් සසඳන්න
- ඔබ ආදායම්, හුවමාරු හා වියදම් වාර්තා මෙන්ම රිසිට්පත්, ඉන්වොයිස් සහ සහයක ලේඛන තබා ගන්නා බව තහවුරු කරගන්න
- මුදල් තිබූ තැන සහ ගිය තැන පිළිබඳ සෙවිල්ලෙන් සිටීමට ගෙවීම් ගනුදෙනු සඳහා විද්‍යුත් මුදල් හුවමාරුව සහ ඉලෙක්ට්‍රොනික බැංකු ගනුදෙනු වැනි ඉලෙක්ට්‍රොතනික ක්‍රතම භාවිතා කරන්න
- ඔබගේ බදු බැඳියා වටහාගෙන ඒවාට අනුකූල වන්න. අපට ඔබගේ බදු නේවාසික තොරතුරු සපයා බදු ලේඛනවල පැහැදිලි වාර්තාවක් පවත්වා ගන්න
- ඔබ සතුව අනන්‍යාතා ලේඛන කිහිපයක් තිබේ නම්, සැමවිටම ඔබගේ බැංකුවට එකම අනනේ‍යතා ලේඛන තොරතුරක් ඉදිරිපත් කරන්න. ඔබගේ අනන්‍යරතා ලේඛන සඳහා වන වෙනස්කම් කිසිවක් පිළිබඳව කාලීන ආකාරයකින් ඔබගේ බැංකුව යාවත්කාලීන කරන්න

